# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,691 — 1959 මාර්තු 6 වැනි සිකුරාද — 6.3.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි)

# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 211 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | 212 | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 214 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 217 |



# පළාත් පාලන නිවේදන

ඇල්. ජී. ඩී.-ජී ඊ. 2/32.

**ගම්සභා ආඥාපණත**

1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත පරිදි, ගම් සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 45 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර, පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය ජයවීර කුරුප්පු වන මා විසින් මේ නිවේදනයෙන්, එකී වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ කැලණිය ගම් ප්‍රදේශයේ ඉඩම් බද්දක් පණවා අයකිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම්කායී සභාවට මෙයින් බලය දෙනු ලැබේ.

ජයවීර කුරුප්පු,
පළාත් පාලන සහ සංස්කෘතික අමාත්‍ය තැන.

1959 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ පළාත් පාලන කාර්යාලයේ දිය.

---

**බදුල්ල දිස්ත්‍රික්කයේ පට්ටිපොල කෝරළේ ගම්කායී සභාව**

**1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශොධිත ආඥාපනත**

1951කෝ අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශොධිත ආඥාපනතේ 13 ඒ 1 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අදිකාරි තැනවූද බදුල්ල දිස්ත්‍රික්කයේ පට්ටිපොල කෝරළේ ගම්කායී සභාවේ සභාපතිවූද ටී. සී. ඇලෙක්සැන්ඩර් වන මම 1959 වර්ෂයේ මෙහි පහත සඳහන්වන උප ලේඛනයේ දක්වෙන දිනවලදී බදුල්ල දිස්ත්‍රික්කයේ පට්ටිපොල කෝරළේ ගම්කායී සභා ප්‍රදේශ සීමාව ඇතුලත මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

උපලේඛනය

| | |
|---|---|
| ජනවාරි ... ... ... | 8, 24 |
| පෙබරවාරි ... ... ... | 7, 23 |
| මාර්තු ... ... ... | 8, 24 |
| අප්‍රේල් ... ... ... | 7, 22 |
| මැයි ... ... ... | 6, 21, 22 |
| ජූනි ... ... ... | 6, 21 |
| ජූලි ... ... ... | 6, 20 |
| අගෝස්තු ... ... ... | 4, 18 |
| සැප්තැම්බර් ... ... ... | 3, 17 |
| ඔක්තෝබර් ... ... ... | 2, 16 |
| නොවැම්බර් ... ... ... | 2, 15, 30 |
| දෙසැම්බර් ... ... ... | 7, 23 |

ටී. සී. ඇලෙක්සැන්ඩර්,
ප්‍රධානතැන.

1959 පෙබරවාරි මස 16 දින පට්ටිපොල
ගම්සභා කායඞාලයේදිය, ලුනුගල.

## උඩුනුවර කඳුපළාත ගම්කායසී සභාව

**1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශොධිත ආඥාපනත**

1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශොධිත ආඥාපනතේ 13 ඒ දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධාරියාවූ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳුපළාත ගම්කායසී සභාවේ සභාපති යූ. ඇල්. නූර්මොහමඩ් වන මම, 1959 වර්ෂයේ පහත දක්වෙන උපලේඛනයේ සඳහන් වන දිනවලදී උඩුනුවර කඳුපළාත ගම්කායසී සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ විකිණීම මෙයින් තහනම් කරමි:—

1959 ජනවාරි මස 23 වැනි දින අංක 11,645 දරණ ලංකාණ්ඩුවේ "ගැසට්" පතේ පළවූ යටකී ආඥාපනත පිළිබඳ උපලේඛනයේ තුන් වැනි වගන්තිය "1959 මාර්තු 23" නොව "1959 මාර්තු 24" යන්න යෙදීමෙන් මෙයින් සංශොධනය කරමි.

යූ. ඇල්. නූර්මොහමඩ්,
උඩුනුවර කඳුපළාත ගම්කායසී සභාවේ සභාපති තැන.

1959-2-25 වැනි දින,
උඩුනුවර කඳුපළාත ගම්සභා කායසීලයේදීය,
වෙළම්බොඩ.

---

# තනතුරු—ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී, ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, 1946 අංක 5 දරන පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥා පනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධාන වලට ද 1945 අංක 43 දරන ආඥාපනත පිළිබඳ ව තවදුරටත් කෙරෙන සංශෝධනවලට ද ඒ ආඥාපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

3. **සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලෙඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලෙඛනයට එකතු කරන අනිත් තනතුර ද ස්ත්‍රීන් නො වන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරු කරනු ලැබූ දිනයට ඉස්සරින් දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටු වන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3 ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරු වලට පත්වන්නන්ට නියම කළ හැකි ය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනට ම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට, දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම වර්ෂයක ආධුනික කාලයකට හෝ වර්ෂයකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් විසින් ස්වකීය වයස තහවුරු කිරීම පිණිස උප්පැන්න සහතික පිටපත් අමුණා එවිය යුතුයි. දිවුරුම් පෙත්සම් නො පිළිගනු ලැබේ. උප්පැන්න සහතික පිටපත් අමුණා නැති කල්හි අයදුම්කරුවෝ සුදුසුකම් නැත්තවුන් ලෙස සලකනු ලැබෙති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකික යකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූ මෙකී.

5. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස, නො කඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

7. ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට ම අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යාම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයන් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම් සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් වනාහි මීට යා කොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පතේ ආකෘතිය

### පළාත් පාලන සේවය

.........................................තනතුර සඳහා වූ අයදුම්පත යි

(1) දැන්වීමේ සම්බන්ධය :————.

(2) සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

ජාතිය :————.

(ඉහත සඳහන් 4 වැනි කොන්දේසියේ අර්ථ නිරූපණය අනුව ලාංකිකයෙක් ද නැද්ද යනු සඳහන් කරනු)

(3) සම්පූර්ණ තැපැල් ලිපිනය :————.

(4) වයස හා උපන් දිනය :————.

(5) උපන් ස්ථානය—
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

(6) විවාහක ද අවිවාහක ද ? :————.

(7) අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය (දිනයත් සමග)—

(අ) ඉංග්‍රීසි :————.

(ආ) සිංහල/දෙමළ :————.

(8) ඉගෙන ගත් පාඨශාලාව සහ පාඨශාලාවෙන් අස් වූ දිනය : ————.

(9) (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා :————. (දිනයත් හා සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර ද සඳහන් කළ යුතුය.)

(ආ) මීට කලින් ආණ්ඩුව යටතේ සේවය කෙළේ නම් සේවය නතර කිරීමේ හේතුවත් සමග සේවය පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

(ඇ) පළාත් පාලන සේවා සාමාජිකයෙක් නම්—

(i) දැනට දරන තනතුරේ නම සහ ශ්‍රේණිය :————.

(ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) පළාත් පාලන මණ්ඩලවල සේවය පිළිබඳ වාර්තා සටහන :————.

(ඈ) සේවා මුක්ත භටයෙක් නම්—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණ දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

(10) සිංහල හා දෙමළ යන භාෂා කියවීම, ලිවීම හා භාෂණ පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාව :————.

(11) විශේෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————. (වෘත්තීය හා ශිල්පීය සුදුසුකම් ආදිය මෙනි)

(12) විශේෂ හිමිකම් ආදියක් ඇතොත් ඒ පිළිබඳ විස්තර : ————.

(අයදුම්කරු ඉල්ලුම්කර සිටින තනතුර වැනි තනතුරක සේවය කිරීමෙන් ලබා ඇති පළපුරුද්ද මෙනි)

(13) තෝරා ගනු ලැබුවහොත්, බලාපොරොත්තු වන වැටුප : ————.

(14) චරිත සහතික ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම :————.

(ඒ සහතිකවල මුල් ලිපි නොව ඒවායේ පිටපත් පමණක් ඇමිණිය යුතුයි)

(15) පළාත් පාලන සේවය යටතේ සේවය කෙළේ ද, එසේ නම් කිසියම් අවස්ථාවක සේවය නතර කරනු ලැබුවේද ? ————.

(16) කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

(17) ණයතුරුස් වලින් හෝ මුදල් කරදර වලින් නිදහස් ද : ————.

(18) ප්‍රධාන මූලාදෑනියාගෙන් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගෙන් හෝ සමාදාන විනිශ්චයකාරයකුගෙන් හෝ දේවගැතිවරයකුගෙන් හෝ ලබාගත් පදිංචිය පිළිබඳ සහතික (පදිංචිය පිළිබඳ සහතිකයක් අවශ්‍ය වන අවස්ථාවල දී) : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

### පළාත් පාලන සේවය

#### වින්නඹු සේවිකා තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා, පළාත් පාලන සේවා කොමිෂන් සභාව මගින් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. තෝරාගනු ලැබූ අයදුම්කරු පළමු වැනි වරට තංගල්ල පළාත් ආණ්ඩු සභාවට පත් කරනු ලැබෙයි.

2. **වැටුප් ක්‍රමය**— මේ තනතුරට අයත් වාර්ෂික වැටුප් රුපියල් 666 න් පටන් ගෙන, වර්ෂයකට රුපියල් 42 බැගින් වැඩිවී රුපියල් 1,296 තෙක් නගී. එහි රුපියල් 1,044 වාර්ෂික වැටුපට ප්‍රථමයෙන් කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස : —1959 මාර්තු මස 20 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතු යි.

(ආ) අයදුම්කරුවෝ සෞඛ්‍යසේවා අධ්‍යක්ෂතුමාගේ දක්ෂතා පිළිබඳ සහතික දරන ලියාපදිංචි වූ වින්නඹු සේවිකාවෝ විය යුතු යි. සෞඛ්‍ය මණ්ඩල වැඩ ගැන පළපුරුද්දක් ඇති, සිංහලෙන් හා දෙමළෙන් කතා කළ හැකි අය ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

4. මේ ගැසට් පත්‍රයේ හතර වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1959 මාර්තු මස 20 දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි 18 වැනි ශීර්ෂය කපා හරින්න.

6. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම්පත්‍රය, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුවහොත් වහාම ඒ බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම්පත්‍රය සළකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙසිනම් එය නැති වන්නේ ය.

ඊ. ඇf්ජ්. ඩයස් අබේසිංහ
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති,

1959 පෙබරවාරි 28 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

ඇල්. ජී. සී.—ජීජේ 9/16.

# අතුරු ව්‍යවස්ථා

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන්කෝරළේ මැදපත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමැති තුමා කෙරෙහි පැවැරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යකායභාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 පෙබරවාරි මස 13 වෙනි දින
කොළඹදීය.

### රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා

1. (1) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයෙහි සඳහන් පෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධානතුමාට යැවිය යුතුයි. මේ පෝර්ම ගම්කාර්ය සභා කාර්යාලයෙන් ලබාගත හැක.

(2) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වර්ෂය වෙනුවෙන් (1) වැනි ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණ කොට 1959යේ පෙබරවාරි මස 28 වෙනි දින හෝ ඊට මත්තෙන් ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන්වත් එකී අයගේ එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47(2) වගන්තියේ විධිවිධාන වලට යටත්ව 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තවදුරටත් දැනුම්දෙනු ලැබිමක් නැතිව—

(අ) උපලේඛනයේ සඳහන් රථවාහන සහ සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස 31 වෙනි දින හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරනු ලදුව එකී වර්ෂයේ දවස් 30 කට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහා වූ බද්ද එකී වර්ෂයේ මාර්තු 31 වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම්කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූද ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එක්කෝ ඉහතින් සඳහන් අතුරු ව්‍යවස්ථා යටතේ යම් උප ලේඛනයක් සපයා නැත්තාවූ යම්කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමු වරට අත්පත් කරගෙන තබා ගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගැනීමේ හෝ තබාගැනීමේ නොහොත් පාවිච්චි කිරීමට පටන්ගැනීමේ දින සිට මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වෙනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහා වූ බද්ද ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාලසීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් හෝ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47(3) වෙනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතුන් නිසා යයි දක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමාට යැවිය යුතුයි.

(2) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියා වූ සෑම අයෙකු විසින් ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හල බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම්කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහන වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් දෙවෙනි උපලේඛනයෙහි ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද තහඩුද නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද රථවාහන රිජිස්ටරයේ ඒ ඒ රථවාහනය පිළිබඳව වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකීගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධාන තුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පනහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ.

7. සෑම රථවාහන අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහන වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනෙක සවිකළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් ඒ රථවාහනයෙහි 7 වෙනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂා කර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධානතුමා විසින් හෝ එකී නිලධාරියා විසින් හෝ ඉල්ලීමක් කර සිටින කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතුයි.

### "ඒ" උපලේඛනය

#### පෝර්මය

##### අටකලන්කෝරළේ මැදපත්තු ගම්කාර්ය සභාව

රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතුවූ රථවාහන හා/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ඡන්දදායක කොට්ඨාශය :————.

ගම :————.

| රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන වචන වලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින්රික්ෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක වාහන ... | | |
| ගොන්දෙන්නා බඳින කරත්ත ... | | |
| තනිගොනා බඳින කරත්ත හා තිරික්කල ... ... | | |
| ජින්රික්ෂෝ රථ ... | | |
| බයිසිකල් (බයිසිකලයක් නම් එහි වර්ගය හා නොම්මරය සඳහන් කරනු ... ... | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

* නුවමනා වචන කපාහරිනු.

මෙහි ඉහත සඳහන් විස්තර සෑම අතින්ම සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

————.
අයිතිකාරයාගේ අත්සන.

දිනය :————.

## "බී" උපලේඛනය

| | |
|---|---|
| කරත්තයක,, තිරික්කලයක් හෝ ජීන් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | මැ.අ.ර. |
| ගොන්දෙන්නා බඳින සෑම කරත්තයකට ... | මැ.අ.බ.ක. |
| තනිගොනා බඳින සෑම කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | මැ.අ.බ.බා. |
| සෑම ජීන් රික්ෂෝ රථයකට ... ... | මැ.අ.ජී.ර. |
| සෑම බයිසිකලයකට ... ... | මැ.අ.බ. |

### අප්‍රසන්නවූ හා ආන්තරායදායක කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා

9. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(ඒ) ජාඩි හෝ කරවල ගබඩා කිරීම ;
(බී) තොග ගණනේ විකිණීම පිණිස නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම ;
(සී) කොම්පෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම ;
(ඩී) විනාකිරි සෑදීම ;
(ඊ) සබන් සෑදීම ;
(ඇෆ්) දුම්කොළ වියලා සකස් කිරීම;
(ජී) හම් පදම්කරන ස්ථානයක් තබාගැනීම ;
(එච්) පුවක් වියලා සකස් කිරීම ;
(අයි) සතුන්ගේ ලේ හෝ මලකුණු හෝ උණුකිරීම ;
(ජේ) සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම ;
(කේ) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම්ගැස්සීම හෝ සෑදීම ;
(ඇල්) කෘතිම පොහොර හෝ කෘතිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම ;
(ඇම්) සෝඩා සෑදීම ;
(ඇන්) ලැලි පොඟවා සකස්කිරීම ;
(ඕ) මාළු අයිස් දැමීම ;
(පී) සුරුට්ටු සිගරට් හෝ බීඩි සෑදීම ;
(කිව්) පැණි හෝ හකුරු සෑදීම.

10. පහත සඳහන් කර්මාන්ත අන්තරාදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(ඒ) තේ කර්මාන්ත ශාලාවක් තබාගැනීම ;
(බී) කොප්පරා සෑදීම ;
(සී) තෙල්වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්රල් ආදී දැවෙන ද්‍රව්‍ය වලින් හෝ ඉලෙක්ට්‍රික් බලයෙන් හෝ ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන යම් කර්මාන්තයක් ;
(ඩී) කබුක් ගල්, බොරළු, කළුගල් ලබාගැනීමට වලවල් කැණීම හෝ වලවල් තබාගැනීම ;
(ඊ) මිනිරන් වියලීම හෝ ගබඩා කිරීම ;
(ඇෆ්) වලක් කැනීමෙන් හුණුගල් ලබාගැනීම ;
(ජී) හාල් හෝ වී මෝලක් තබාගැනීම ;
(එච්) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල්තෙල් සිඳීම ;
(අයි) සෙක්කුවකින් පොල්තෙල් සිඳීම ;
(ජේ) දර හෝ ලීමඩුවක් තබාගැනීම ;
(කේ) කෙඳි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම ;
(ඇල්) කපු පුළුන්, තූල් හෝ පිදුරු ගබඩා කිරීම ;
(ඇම්) භූමිතෙල් ගබඩාවක් තබාගැනීම ;
(ඇන්) මුද්‍රණාලයක් තබාගැනීම ;
(ඕ) කපාපු පොල් සකස් කිරීම ;
(පී) ස්වර්ණාභරණ සෑදීම ;
(කියු) අම්ලකර වායුව පාවිච්චි කරන ලෝකුරු වැඩ කිරීම ;
(ආර්) අම්ලකර වායුව පාවිච්චි කරන ගරාජයක් තබාගැනීම ;
(ඇස්) කොප්පරා ගබඩා කිරීම ;
(ටී) අඟුරු ගබඩා කිරීම ;
(යූ) කම්මලක් තබාගැනීම ;
(වී) වඩුමඩුවක් තබාගැනීම ;

11. පහත දැක්වෙන කර්මාන්ත අන්තරායදායක හා අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(ඒ) කෙඳිවර්ග සායම් කිරීම ;
(බී) ගඩොල් හෝ උළු පිච්චීම ;
(සී) බැටරි චාජ්කිරීම ;
(ඩී) අඟුරු සඳහා පොල්කටු පිච්චීම ;
(ඊ) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම සකස්කිරීම හෝ කැබැලි කිරීම ;
(ඇෆ්) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් මිරිස් හෝ කුළුබඩු ඇඹරීම සඳහා ස්ථානයක් තබා ගැනීම;
(ජී) රබර් ගබඩා කිරීම ;
(එච්) මෝටර් රථ පිරිසිදු කිරීමේ ස්ථානයක් තබාගැනීම (සර්විස් කිරීම);
(අයි) බයිසිකල් හෝ මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් තබාගැනීම ;
(ජේ) ලිබඩු සෑදීම ;
(කේ) රා එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වා ගෙනයාම.

### ගොඩනැගිලි සහ තාප්ප බැඳීම

12. (1) කිසිවෙකු විසින් ගම් ප්‍රදෙශය තුළ—

(ඒ) ඕනෑම ගම්බද පාරක හරිමැද සිට අඩි පහලොවක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ
(බී) යථා කාලයේදී ගම්බද පාරක් බවට පත්කරනු ලැබිය හැකි යයි කාර්ය සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ ඕනෑම් පාරක් මැද සිට අඩි පහලොවක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ
(සී) (බී) උප ජේදයේ සඳහන් කරන ලද පාරකින් බාහිරවූ වෙනත් කිසියම් ගම්බද පාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත හෝ කිසියම් අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදීම නොකළ යුතුයී.

(2) කිසිවෙකු විසින් ප්‍රධානතුමා වෙත මසකට කලින් ලියවිල්ලක මාර්ගයෙන් කරන ලද දැන්වීමක් නොමැතිව, මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ජේදයේ සඳහන් ගම්බද පාරක් ඔස්සේ කිසියම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ගම්ප්‍රදේශය ඇතුළත සෑදීම නොකළ යුතුයි.

13. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් ගම්කාර්ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ.
"කාර්ය සභාව" යනුවෙන් ගම්ප්‍රදේශයේ ගම්කායර්‍ය සභාව අදහස් කරනු ලැබේ.
"ගම්ප්‍රදේශය" යනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ මැදපත්තු ගම්ප්‍රදේශය අදහස් කරනු ලැබේ.
"ආඥපනත" යනුවෙන් ගම්සභා ආඥපනත (198 වෙනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

---

ඇල්. ජී. ඩී./ජ්ජේ 9/33/1.

### ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුලුගම් කෝරළේ නැගෙනහිර සහ අටුලුගම් කෝරළේ බස්නාහිර ගම් ප්‍රදේශයේ ගම්කායර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වෙනි දින අංක 9,773 දරණ "ගැසට් අතිරේකයේ" පළවූ ප්‍රකාශනයෙන් සංශොධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත්පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කායර්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1959 පෙබරවාරි මස 2 වැනි දින,
කොළඹ.

### ගොඩනැගිලි හා මායිම් තාප්ප තැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. (1) කිසිවකු විසින් ගම් ප්‍රදෙශය තුල—

(එ) ඕනෑම ගම්සභා පාරක් මැද සිට අඩි පහලොවක දුර ප්‍රමාණයක් ඇතුලත, හෝ
(බී) යථාකාලයේදී ගම්බද පාරක් බවට පත්කරනු ලැබිය හැකි යයි ගම්කායර්‍ය සභාව විසින් ,දැනුම්දෙනු ලැබුවාවූ ඕනෑම ගම්බද පාරක් මැද සිට අඩි පහලොවක ප්‍රමාණයක් ඇතුලත,
(සී) මේ ජේදයේ (බී) උප ජේදයේ සඳහන් කරනලද අඩි පාරකින් බාහිරවූ ඕනෑම ගම්බද අඩිපාරක් හෝ දෙවට පාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුලත අලුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

(2) කිසිවෙකු විසින් ලියවිල්ලකින්වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව ප්‍රධාන තුමාට දැනුම් නොදී මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වෙනි ජේදයේ සඳහන් කරන ලද ඕනෑම ගම්බද පාරක් හෝ මාවතක් හෝ අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ගම්ප්‍රදේශය ඇතුලත සෑදිය යුතු නැත.

2. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කායර්‍ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ ;
"කායර්‍ය සභාව" යනුවෙන් ගම්කායර්‍ය සභාව අදහස් කරනු ලැබේ ;
"ගම්ප්‍රදෙශය" යනුවෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුලුගම් කෝරළේ නැගෙනහිර සහ අටුලුගම් කෝරළේ බස්නාහිර ගම්ප්‍රදේශය අදහස් කරනු ලැබේ ;
"ගම්බද පාර" යනුවෙන් ගම්කායර්‍ය සභාව මගින් නඩත්තු කරගෙන යනු ලබන්නා වූද පළලින් අඩි නවයකට වඩා අඩු නොවූද පාරක් අදහස් කරනු ලැබේ ;
"ගම්බද මාවත" යනුවෙන් කායර්‍ය සභාව විසින් නඩත්තු කරගෙන යනු ලබන්නාවූද පළලින් අඩි නවයකට වඩා අඩු වූද පාරක් අදහස් කරනු ලැබේ.

ඇල්. ජී. සී.—ජී. සී. 14/22

## ගම් සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොකරැල්ල ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9773 ගැසට් අතිරේකයේ පළමු ප්‍රකාශන යෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය.
පළාත් පාලන හා සංසකෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍ය්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන

1959 පෙබරවාරි 13 දින,
කොළඹ.

**රථවාහන හා සතුන් පිළිබඳ බද්ද පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. 1 ආඥාපණතේ 47 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සැම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් උප ලෙඛනයෙහි "ඒ" ෆෝර්මයේ ප්‍රකාර විස්තර උප ලේඛනයක් ප්‍රධානතුමාට සැපයිය යුතුයි. මේ ෆෝර්ම ගම්කාර්‍ය්‍ය සභා කාර්‍ය්‍යාලයෙන් ලබාගත හැක.

2. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට සිටින අය විසින් 1959 වැනි වර්‍ෂය වෙනුවෙන් (1) වැනි ඡේදයේ සඳහන් ඒ උප ලේඛනය සම්පූර්ණකොට 1959 පෙබරවාරි මස 28 වැනි දින හෝ ඊට මත්තෙන් ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිය හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උප ලෙඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ—සඳහන් උප ලෙඛනය සැපයුවාවූ සැම අයෙක්ම තවදුරටත් දැනුම්දෙනු ලැබීමක් නැතිව (අ) උපලෙඛන යෙහි සඳහන් රථවාහන හා සතුන් සඳහා වූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස 31 වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත්වෙති, තවද (ආ) ඊට පසු එක් එක් වර්‍ෂය වෙනු වෙන් ඒ උප ලෙඛනයෙහි සඳහන් කරන ලදුව එකී වර්‍ෂයේ, දවස් තිහකට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහා වූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස 31 වැනිදාට හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත්වෙති.

3. (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලෙඛනයෙහි සැපයූවාට පසු යම් කිසිවකු විසින් ඒ උපලෙඛනයේ සඳහන් නොකරන ලද්ද වූද ආඥාපණත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත්කරගෙන තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම් එක්කෝ ඉහතින් සඳහන් අතුරු ව්‍යවස්ථා යටතේ යම් උප ලෙඛනයක් සපයා නැත්තාවූ යම්කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත්කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චිකිරීමට පටන් ගැනීමේ දින සිට එක් මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති උපලෙඛනයේ "ඒ" ෆෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත්කරගත් බව ප්‍රධානතුමාට දැනුම්දිය යුතුයි

4. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 3 වැනි ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් ලේඛනය සැපයුවා වූ සැම අයෙක්ම එකී ලෙඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද ඊට පසු සැම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමා භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම්දෙනු ලබන යම් කාලසීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලෙඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ උප ලෙඛනයට ඇතුලත් කළාවූ හෝ ලෙඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සැම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතූන් නිසායයි දක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධානතුමා වෙත එවිය යුතුයි.

2. (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයූ වාට පසු ඒ රථවාහන හෝ සතා තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතරකළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සැම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ රථවාහනය හෝ සතා තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතරකළබව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හළ බව වහාම ප්‍රධානතුමා වෙත ලියවිල් ලකින් දැනුම්දිය යුතුයි.

6. යම්කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධානතුමා විසින් හෝ බද්ද අයකිරීමට එතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙක් විසින් හෝ ඒ බද්ද ගෙවූ රථවාහන වෙනුවෙන් ඒ අයට මීට යාකොට ඇති උපලෙඛනයෙහි "බී" ෆෝර්මයේ ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශෙෂ අකුරු තහඩුද නිකුත්කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද රථවාහන රෙජිස්ට්‍රයේ ඒ ඒ රථවාහන පිළිබඳ වූ අංකයද සටහන්කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකීගොස් තිබෙහොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබාගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩු වක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තුගැනීමට සැලැස්සුව හොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සැම රථවාහන අයිතිකාරයෙකු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධාන තුමා විසින් හෝ එතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම පොලිස් නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ ඕනෑම පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් ඒ රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථා වේ ප්‍රකාර සවි කොට තිබිය යුතු තහඩුව පරීක්ෂා කර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධාන තුමා විසින් හෝ එකී නිලධාරියා විසින් හෝ ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක් භාරකාරයා විසින් හෝ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට හෝ පොලිස් නිලධාරියාට එකී තහඩුව පරීක්‍ෂා කිරීමට ඉඩ දිය යුතුයි.

9 කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇතැම් ගම්කාර්‍ය්‍ය සභාවන් විසින් සම්පාදිතව, 1940 අගෝස්තු 23 වැනි දින අංක 8655 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධ යෙන් වූ අතුරු ව්‍යවස්ථා අවලංගු කරනු ලැබීමෙන් ඒවා ගොකරැල්ල ගම් ප්‍රදේශයට පමණක් අදාලවන පරිද්දෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10 මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ..

"කාර්‍ය්‍ය සභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොකරැල්ල ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපණත" යනුවෙන් ගම්සභා ආඥාපණත (198 පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

### උපලෙඛනය

"ඒ" ෆෝර්මය

**ගොකරැල්ල ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව**

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා/හෝ* සතුන් පිළිබඳ ලෙඛනයයි.

ඡන්දදායක කොට්ඨාශයේ අංකය හෝ නම.

අයිතිකාරයාගේ නම :—

ගම :—

| රථවාහන හා/'හෝ * සතුන් පිළිබඳ විස්තරය | ගණන වචන වලින් | වෙනත් විස්තර–බයිසිකල යක් නම් සාදන ලද අයගේ නොම්මරය සඳහන්කරනු |
|---|---|---|
| ක්‍රත්ත තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක වාහන | | |
| ගොන් දෙන්නා බඳින බරකරත්ත හෝ තිරික්කල | | |
| බරබාග කරත්ත හෝ තිරික්කල අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ රථ ... | | |
| බයිසිකල් ... ... | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

මගේ දැනීමේ හැටියට ඉහත සඳහන් ප්‍රකාශය සත්‍ය බවට මම මෙයින් සහතික කරමි.

දිනය : ————.

————

අයිතිකරුගේ අත්සන.

* නුවමනා වචනය කපා හරිනු.

**"බී" පෝර්මය**

| | |
|---|---|
| අත්කරත්තයක්, තිරික්කලයක් හෝ ජින්රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... | ගො.ර |
| සෑම ගොන් දෙන්නා බඳින බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | ගො.බ.ක. |
| සෑම තනිගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | ගො.බා.ක |
| සෑම ජින්රික්ෂෝ රථයක් සඳහා ... ... | ගො.ජි. |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | ගො.අ.ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | ගො.බ. |

---

ඇල්. ජී. ඩී. ජී ජී 28/38/24

**ගම්සභා ආඥාපනත**

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ, කොළඹ දිස්ත්‍රික්කයේ ආඩි අම්බලම ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර මස 24 වැනි දින අංක 9773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ පළාත් පාලන කාර්යාලයේ දීය.

**අශුචි ඉවත් කිරීම හා කසළ ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

ආඩිඅම්බලම ගම්කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කසළ ශෝධනය පිළිබඳව අතුරු ව්‍යවස්ථාවල vi වැනි කාණ්ඩය, එහි ii අතුරු ව්‍යවස්ථාවේ "කසළ ශෝධන සේවය" යන වචන අස්කොට ඒ වෙනුවට, "කසළ ශෝධන සේවය සහ කිසියම් කර්මාන්තයක් හෝ වෙළඳ ව්‍යාපාරයක් හෝ පිළිබඳ කාරණා සඳහා සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් හෝ පාවිච්චි කරන" යන වචන යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

---

# විවිධ දැන්වීම්

## මාතලේ මැදසිය පත්තු ගම්කාර්‍ය්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඬ වන මාතලේ මැදසිය පත්තු ගම්කාර්‍ය්‍ය සභා ප්‍රදෙශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණ සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම "ගැසට් පත්‍රයේ" පළ වන දිනය සිට 14 දිනක් ඇතුළත මං වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත යටතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 අංක 44 දරන ආඥාපනතින් සංශොධිත වූ අංක 6 දරන ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| කේ ඒ. හමීඩ්, වරකාමුර උකුවෙල. | කොරක ගහමුල විත්තේ හරක්මස් කඩය. |

ඇම්. බී. කුලතුංග,
මාතලේ මැදසිය පත්තු ගම්කාර්‍ය්‍ය සභාවේ
ප්‍රධාන තැන.

වර්ෂ 1959ක්වූ පෙබරවාරි මස 27 වෙනි දින,
මාතලේ මැදසිය පත්තු ගම්කාර්‍ය්‍ය සභා කාර්‍ය්‍යාලයේදීය.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඩ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඩ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... .... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. **මේවා කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී